සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## නාට්‍ය හා රංගකලාව - I

13 ශ්‍රේණිය

කාලය පැය 01 යි.

- වඩාත් නිවැරදි පිළිතුර තෝරා අදාළ අංකය තෝරා වරහන් තුළ ලියන්න.

---

- පහත දැක්වෙන දෙබස් කාණ්ඩය ආශ්‍රයෙන් අංක 01 සිට 05 දක්වා පිළිතුරු සපයන්න.

A - "මම උදයන්ට හත් දවසක් කල් දුන්නා මට මන්තරේ උගන්වන්න. එයා ඒක කෙරුවෙ නෑ."

B - "ඔයගොල්ලො යන්ඩ. මොකක්ද හිත යට හංගාගෙන නෙ ඔය කතා කරන්නෙ. ඔය ගොල්ල කියන ඒවා අහන්ඩ මට ඕනෑ කමක් නෑ."

C - "බිය ගුල්ලෝ හැමදාටම මැරෙන්න කලින් දහස්වාරයක් මැරෙනවා. එක නිර්භීත මිනිසෙක් මරණයේ මිහිර විඳින්නේ එකපාරයි.

D - "කවුරුවත් නොවෙයි මමමයි කරගත්තෙ ආයුබෝවන්. මගේ කරුණාවන්ත ස්වාමියාව මම මතක් කෙරුවයි කියාපන් ආයුබෝවන්."

E - "අමුත්තෙකුගෙ කාමරේ රයක් ගතකරන්නට මම පුළුවන් කමක් නැහැ."

(01) ෂේක්ස්පියර්ගේ නාට්‍ය දෙකකට අයත් සංවාද වන්නේ,

(1) A හා B (2) C හා D (3) D හා E
(4) A හා C (5) C හා E (........)

(02) යථාර්ථවාදී රංග රීතිය අනුගමනය කළ නාට්‍ය නියෝජනය කරන්නේ,

(1) A හීය. (2) B හීය. (3) C හීය. (4) D හීය. (5) E හීය. (........)

(03) සංස්කෘත නාට්‍ය කලාවට අයත් සංවාද අඩංගු වන්නේ,

(1) A (2) B (3) C (4) D (5) E (........)

(04) ජූලියස් සීසර් නාට්‍යයට අයත් සංවාද අඩංගු වනුයේ,

(1) A (2) B (3) C (4) D (5) E (........)

(05) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය නිර්මාණයක් නියෝජනය කරන්නේ,

(1) A (2) B (3) C (4) D (5) E (........)

(06) වඩමෝඩි, තෙන්මෝඩි ප්‍රචලිත ප්‍රදේශ වන්නේ,

(1) හලාවත ය. (2) මඩකලපුව හා වන්නිය. (3) උඩරට පළාත් හා වන්නිය.
(4) මඩකලපුව හා යාපනය. (5) යාපනය හා හලාවත. (........)

(07) පළමු මාසයට කිරි ඉතිරවීම යතාර්ථය දෙන ආගමික උත්සවයකි.

(1) දීපවාලී උත්සවය (2) කාවඩි උත්සවය (3) තේරා උත්සවය
(4) නවරාත්‍රී උත්සවය (5) තෛයිපොංගල් උත්සවය (........)

(08) ශේක්ෂ්පියර්ගේ ජූලියස් සීසර් නාට්‍යයට අදාළ මූලාශ්‍රය වන්නේ,

(1) හෝමර්ගේ ඉලියඩ්ය. (2) වර්ජිල්ගේ මෙටමොෆෝසිස්ය.
(3) වර්ජිල්ගේ ඊනියඩ්ය. (4) හෝමර්ගේ ඔඩීසිය.
(5) සොෆොක්ලීස්ගේ ඊඩිපස් ය. (........)

(09) 'ස්කීන' යනුවෙන් හඳුන්වන්නේ,

(1) කබුකි වේදිකාවයි. (2) නෝ වේදිකාවයි (3) එලිසබීනියානු රඟහලයි.
(4) පින්තූරු රාමු වේදිකාවයි. (5) ග්‍රීක නේපත්‍යාගාරයයි. (........)

(10) ශේක්ෂ්පියර් නාට්‍ය රඟදක්වන ලද්දේ,

(1) පූර්ව භාගයේ දීය. (2) අපර භාගයේ දීය. (3) රාත්‍රීයේ දීය.
(4) සන්ධ්‍යාවේ දීය. (5) වේලාවක් දක්වා නැත. (........)

(11) නාට්‍යයක ප්‍රධාන අංග 03 ලෙස 'කථාවස්තුව, නාටකයා, රස" යයි ප්‍රකාශ කරන ලද්දේ,

(1) භරතමුනිය. (2) ඇරිස්ටෝටල්ය. (3) ධනංජයය.
(4) ප්ලේටෝය. (5) අභිනව ගුප්ත ය. (........)

(12) යුගේන් කිනම් නාටකලාවක් හා සම්බන්ධ ද?

(1) ග්‍රීක (2) එළිසබතීන (3) කබුකි
(4) නෝ (5) සංස්කෘත (........)

(13) නෝ නාට්‍ය කලාවේ අත්පොතකි.

(1) දෝජෝ විහාරය (2) සුමදිතදිය (3) ෆුෂිකදෙන්
(4) ගෙන්ශයිමොනො (5) යුගෙන් (........)

- **පහත කරුණු උපයෝගී කරගෙන අංක 14 සිට 20 දක්වා පිළිතුරු සපයන්න.**

| | | |
|---|---|---|
| A - අසනය | E - ප්‍රත්‍යාවර්තනය | I - බූතයි |
| B - තදාත්ම විසටනය | F - ජනවන්දනා නාට්‍ය | J - හාව්මිඩ් |
| C - ප්‍රකරණ | G - පැරඩෝස් | K - සඳුපදේශ |
| D - වේදිකා පාලක | H - බිංදු | L - සෙඅමි |

(14) ග්‍රීක නාට්‍ය හා සම්බන්ධ වන්නේ,

(1) CH (2) EG (3) FK (4) IL (5) AD (........)

(15) සංස්කෘත නාට්‍ය හා සම්බන්ධ වන්නේ,

(1) CD (2) EG (3) ACH (4) AB (5) KG (........)

(16) නෝ නාට්‍ය කලාව හා සම්බන්ධ වේ.

(1) IL (2) CH (3) EG (4) AD (5) BF (........)

(17) මධ්‍යකාලීන යුරෝපීය නාට්‍ය හා සම්බන්ධ අක්ෂර වන්නේ,

(1) IL (2) CH (3) EG (4) KF (5) HJ (........)

(18) නූතන යුරෝපීය නාට්‍ය හා සම්බන්ධ අක්ෂරය දැක්වෙන්නේ,

(1) IA (2) FR (3) B (4) J (5) HL (........)

(19) පොදුවේ නාට්‍ය කලාව හා සම්බන්ධවේ.

(1) AD (2) BF (3) HC (4) IL (5) JK (........)

(20) කබුකි නාට්‍ය හා සම්බන්ධ අක්ෂරය වන්නේ,

(1) I (2) L (3) F (4) J (5) C (........)

(21) නෝ නාට්‍යයක ප්‍රධාන නළුවා,

(1) ෂිතෙ (2) වකී (3) කොකතා
(4) ෂිතෙන්සුරේ (5) වකීන්සුරේ (........)

(22) ඉංග්‍රීසි නාට්‍ය කලාවේ ස්වර්ණම යුගයයි.

(1) VI වන ජෝර්ජ් රජු කාලයේ ය. (2) වික්ටෝරියා රැජින කාලයේ ය.
(3) VIII වන හෙන්රි රජු කාලයේ ය. (4) I වන එළිසබෙත් රැජින කාලයේ ය.
(5) II වන එළිසබෙත් රැජින කාලයේ ය. (........)

(23) දැනට සංස්කෘත නාට්‍ය වැඩි ම ගණනක් රචනා කරන ලද නාට්‍යකරුවා,

(1) මහාකවි කාලිදාස (2) ශ්‍රී හර්ෂ (3) මහාකවි භාස
(4) භවභූති (5) රාජශේඛර (........)

• **පහත මාතෘකා උපයෝගී කරගනිමින් අංක 24 සිට 26 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - චාරී E - ස්ථානක I - පුස්ත
B - විභාව F - වේෂ්ටිම J - අනුභාව
C - සන්ධිම G - කරණ K - රසික
D - ස්ථම්භ H - හස්ත L - ව්‍යාජිම

(24) ආංගික අභිනය හා සම්බන්ධයි.

(1) AEHG (2) BCJK (3) EFLI
(4) CDFE (5) ABCD (........)

(25) නාට්‍ය රසය හා සම්බන්ධ අක්ෂර ලෙස,

(1) EG (2) BJ (3) KL (4) HI (5) AE (........)

(26) ආහාර්ය අභිනයය හා සම්බන්ධ අක්ෂර වනුයේ,

(1) BJ (2) AE (3) CH (4) BI (5) AD (........)

(27) නළුවන් අවම සංඛ්‍යාවක් භාවිතා කළ නාට්‍ය සම්ප්‍රදාය වනුයේ,

(1) ග්‍රීක නාට්‍යය (2) සංස්කෘත නාට්‍යය (3) මධ්‍යකාලීන යුරෝපීය නාට්‍ය
(4) කබුකි නාට්‍ය (5) එළිසබෙතීන නාට්‍ය (........)

(28) ආගමික මුහුණුවරක් ගත් නාට්‍ය සම්ප්‍රදාය ලෙස,

(1) සංස්කෘත නාට්‍ය (2) නෝ නාට්‍ය (3) ශේක්ෂ්පියර් නාට්‍ය
(4) එළිසබතීන නාට්‍ය (5) ස්වභාවික නාට්‍යය (........)

(29) නාට්‍ය ඉදිරිපත් කිරීමේදී පශ්චාත් දෘෂ්ටිකරණ ක්‍රමය අනුගමනය කළ සම්ප්‍රදාය වන්නේ,

(1) ග්‍රීක නාට්‍යය (2) සංස්කෘත නාට්‍යය
(3) නෝ නාට්‍යය (4) මධ්‍යකාලීන යුරෝපීය නාට්‍ය
(5) එළිසබතීන නාට්‍ය (........)

(30) නාට්‍ය රචනයට හා අධ්‍යක්ෂණයට වෙනම ම පුද්ගලයින් සිටි නාට්‍ය සම්ප්‍රදාය,
(1) නෝ නාට්‍යය (2) ග්‍රීක නාට්‍යය
(3) සංස්කෘත නාට්‍යය (4) මධ්‍යකාලීන යුරෝපීය නාට්‍යය
(5) එළිසබතීන නාට්‍යය (........)

- **අංක 31 සිට 35 දක්වා වූ ප්‍රශ්නවල නොගැලපෙන පිළිතුර තෝරන්න.**

(31) නාට්‍ය ගීතයක ලක්ෂණයකි.
(1) තනුවේ සරල බව (2) සරල පද (3) පුළුල් නාද පරාසය
(4) අර්ථාන්විත බව (5) නාට්‍යමය ගුණය (........)

(32) අංගරචනය යන විෂයයට ඇතුළත් නොවන්නේ,
(1) රැවුල් (2) හිස් පළඳනා (3) වේෂ භූෂණ
(4) මුහුණේ ආලේපන (5) කොණ්ඩා (........)

(33) අංගරචනයෙන් ඉස්මතු කළ හැකි ලක්ෂණ වනුයේ,
(1) චරිතයේ ලක්ෂණ (2) චරිතයේ සමාජ පසුබිම (3) වයස
(4) මනෝභාව (5) ආගමික ඇදහිලි (........)

(34) ස්වතන්ත්‍ර නාට්‍ය පමණක් කළ නාට්‍යකරුවෙකි.
(1) කේ. බී. හේරත් (2) රාජිත දිසානායක (3) ජනක ප්‍රේමලාල්
(4) කපිල කුමාර කාලිංග (5) හෙන්රි ජයසේන (........)

(35) නාඩගමට අයත් නොවන ස්ථාවර පාත්‍රයින් ලෙස,
(1) බහුබූත කෝලම (2) පොතේ ගුරා (3) සෙල්ලං ළමා
(4) බම්මන්නා (5) අන්නවියර් (........)

(36) ප්‍රේක්ෂකයින් අඳුරේ හිඳගෙන, ඉවත් කරන ලද බිත්තියක් ඇති නිවසක සිදුව දෑ හොරෙන් නැරඹීම,
(1) නාට්‍ය ධර්මී ශෛලියයි. (2) තත්වානුරූපී මායාවයි. (3) ලෝක ධර්මී රංග ශෛලයයි.
(4) මිශ්‍ර ශෛලියයි. (5) ස්වාභාවික වාදයේ ලක්ෂණයයි. (........)

(37) 'රාවනේශන් නාට්‍යය' නිර්මාණය කරන ලද්දේ,
(1) කේ. කනපති පිල්ලෙයි (2) එස්. විද්‍යානන්දන් (3) ශන්මුගලිංගම්
(4) කමල දාස් (5) එස්. සිවතම්බි (........)

(38) 'සත්‍යජිත් රායි' ලොව ප්‍රකට,
(1) නාට්‍ය අධ්‍යක්ෂවරයකි. (2) සංගීතඥයෙකි. (3) චිත්‍රපට අධ්‍යක්ෂවරයෙකි.
(4) නර්තන ශිල්පියෙකි. (5) චිත්‍ර ශිල්පියෙකි. (........)

(39) පුතු විසින් මව ඝාතනය කරනු ලබන්නේ කිනම් නාට්‍යයේද?
(1) හිපොලිටස් (2) ඇන්ටිගනී (3) ඊඩිපස් රජ
(4) ඩොයිෆොරොයි (5) මීඩෙයියා (........)

(40) එක් භාෂාවකින් රචිත නාට්‍යයක් දේශීය ලක්ෂණ ඇතුළත්කොට අන්‍ය භාෂාවකට පෙරලීම,
(1) ස්වතන්ත්‍රයි. (2) අනුවර්තනයි. (3) පරිවර්තනයි.
(4) නාට්‍ය ධර්මීය. (5) ලෝක ධර්මීය. (........)

(ල. 01 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# නාට්‍ය හා රංගකලාව - II

**13 ශ්‍රේණිය**

**කාලය පැය 03 යි.**

- **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න 02 බැගින් ගෙන ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.

## A කොටස

01. (i) "ත්‍රිවිධ ඒකීයත්ව සංකල්පය" යනු කුමක්ද? (ලකුණු 4)

(ii) ඔබ උගත් නාට්‍යයක් ඇසුරෙන් එම සංකල්පය පැහදන්න. (ලකුණු 5)

(iii) ග්‍රීක නාට්‍ය ප්‍රදර්ශනය කෙරුණු ස්ථාන පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 6)

02. (i) අභිඥාන ශාකුන්තලයට පදනම් වූ මූලාශ්‍රය දක්වන්න. (ලකුණු 4)

(ii) කාලිදාසයන් පෙළ රචනයේ දී ඊට සිදුකර ඇති වෙනස්කම් මොනවාද? (ලකුණු 5)

(iii) 'අර්ථප්‍රකෘති' යනු මොනවාදැයි සකුන්තලා නාට්‍යය ඇසුරෙන් පහදන්න. (ලකුණු 6)

03. (i) 'අභිනය' යනු කුමක්දැයි පහදන්න. (ලකුණු 4)

(ii) නළු කාර්යයේදී එය යොදාගත යුතු ආකාරය පහදන්න. (ලකුණු 5)

(iii) චරිතයක් සාර්ථක කරගැනීමට නළුවා සතු කාර්ය විස්තර කරන්න. (ලකුණු 6)

## B කොටස

04. (i) ඔතෙලෝ නාට්‍යයේ ඔතලෝගේ චරිතය නිරූපණය වනාකාරය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 4)

(ii) ශේක්ස්පියර්ගේ නාට්‍යවලට ආවේණික ලක්ෂණ පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 5)

(iii) පදනම් විරහිත සැකයේ ආදීනව ඔතෙලෝ නාට්‍යය මගින් නිරූපණය වනාකාරය පැහැදිලි කරන්න. (ලකුණු 6)

05. (i) නූර්තිවලින් පසු සිංහල නාට්‍යය වෙනත් මඟකට ගෙනගිය නාට්‍යකරුවන් කවුරුන්ද? (ලකුණු 4)

(ii) ඔවුන්ගේ නාට්‍යවල විශේෂතා දක්වන්න. (ලකුණු 5)

(iii) 1956 දක්වා නූතන සිංහල නාට්‍යයයේ ඉතිහාසය දක්වන්න. (ලකුණු 6)

06. (i) ඇන්ටිගනී නාට්‍යයයේ ගැටුම් අවස්ථා කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 4)

(ii) නාට්‍යයයේ ගැටුම් අවස්ථා ඇන්ටිගනී නාට්‍යය ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 5)

(iii) ඇන්ටිගනී නාට්‍යය මගින් සොෆොක්ලීස් දෙන පණිවිඩය පැහැදිලි කරන්න. (ලකුණු 6)